## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

**(ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 වාර්ෂික ආර්ථික විවරණයට අතිරේකයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී)**

**මහ බැංකු කටයුතු**

2023 සැප්තැම්බර් 15 - ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම, මුදල් නීති පනත (422 වන අධිකාරය වූ) ඉවත් කිරීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කරන ලදී.

2023 ඔක්තෝබර් 03 - ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, මහ බැංකුවේ උද්ධමන ඉලක්කය නියම කරමින් මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට එළඹෙන ලදී. මෙම ගිවිසුමට අනුව මහ බැංකුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ කාර්තුමය මතුපිට උද්ධමනය ප්‍රතිශතාංක දෙකක ආන්තියක් සහිතව සියයට 5ක මට්ටමේ පවත්වාගෙන යාම අපේක්ෂා කෙරේ.
(2023 ඔක්තෝබර් 5 දිනැති අංක 2352/20 දරන අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ මහජනතාවට දැනුම් දී ඇත.)

**මුදල් ප්‍රතිපත්තිය**

2023 ජනවාරි 02 - 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත හැකි උපරිම වාර ගණන මසකට උපරිම අවස්ථා පහක් (05) දක්වා සීමා කරන ලද අතර, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය ණය පහසුකම ලබාගැනීම ඕනෑම එක් දිනක් සඳහා අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙන් සියයට 90ක් දක්වා සීමා කෙරිණි.

2023 මාර්තු 03 - 2023 මාර්තු 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 15.50ක් සහ සියයට 16.50ක් දක්වා ඉහළ නංවන ලදී.

- එක්සත් ජනපද ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකයේ මධ්‍ය අනුපාතිකය නිවේදනය කිරීම ඔස්සේ වෙළඳපොළ මාර්ගෝපදේශය

[1] 2023 ජනවාරි 01 සිට 2024 මාර්තු 28 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

නිකුත් කිරීම සහ විචල්‍ය ආන්තිකය 2023 මාර්තු 07 වැනි දින බලපැවැත්වෙන පරිදි අත්හිටුවන ලදී.

2023 ජූනි 01 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 250කින්, පිළිවෙළින්, සියයට 13.00ක් සහ සියයට 14.00ක් දක්වා අඩු කරන ලදී.

2023 ජූලි 06 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 200කින්, පිළිවෙළින්, සියයට 11.00ක් සහ සියයට 12.00ක් දක්වා අඩු කරන ලදී.

2023 අගෝස්තු 09 - 2023 අගෝස්තු 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00ක් දක්වා ප්‍රතිශතාංක 2.00කින් අඩු කරන ලදී.

2023 ඔක්තෝබර් 05 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 10.00ක් සහ සියයට 11.00ක් දක්වා අඩු කරන ලදී.

2023 නොවැම්බර් 24 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, සියයට 9.00ක් සහ සියයට 10.00ක් දක්වා අඩු කරන ලදී.

2024 පෙබරවාරි 09 - 2024 පෙබරවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය ණය පහසුකම මත පනවා තිබූ සීමාව ඉවත් කෙරුණු අතර, නිත්‍ය තැන්පතු පහසුකම මත පනවා තිබූ සීමාව මාසයක් තුළ පස් වතාවක (05) සිට දස වතාවක් (10) දක්වා ලිහිල් කරන ලදී.

2024 මාර්තු 26 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, සියයට 8.50ක් සහ සියයට 9.50ක් දක්වා අඩු කරන ලදී.

\- 2024 අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සඳහා පැවති සීමාව ඉවත් කරන ලදී.

**විශේෂ ණය යෝජනා ක්‍රම**

2023 ජනවාරි 01 - ස්වයං රැකියා ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය අදියර -IIහි මෙහෙයුම් කාලය 2023 ජනවාරි 01 සිට 2027 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරීමට රජය සමඟ පරිපාලන ගිවිසුම අත්සන් කරන ලදී.

| | | |
|---|---|---|
| 2023 පෙබරවාරි 15 | - | සහනදායී කොන්දේසි යටතේ, රාජ්‍ය සතු ව්‍යවසායන් නැවත සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන පහසුකම් ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද පහසුකම අදියර - IV අවසන් කරන ලදී. |
| 2023 මාර්තු 22 | - | ජාතික මෙහෙයුම් කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රජා මූලික මූල්‍ය අතරමැදියන් සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් ලෙස ඇතුළත් කිරීමට කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල් වැඩසටහන යටතේ වන 4P ණය යෝජනා ක්‍රමවල මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| | - | ජාතික මෙහෙයුම් කමිටුව විසින් අනුමත කරන ලද ප්‍රජා මූලික මූල්‍ය අතරමැදියන් සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් ලෙස ඇතුළත් කිරීමට සහ උපරිම ණය සීමාව රුපියල් 500,000 දක්වා වැඩි කිරීමට කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල් වැඩසටහන යටතේ ඇති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමවල මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2023 මාර්තු 27 | - | කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියෙ හි මෙහෙයුම් කාලය 2023 ජනවාරි 01 සිට 2023 ජූනි 30 දක්වා දීර්ඝ කිරීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාශය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සමඟ පරිපාලන ගිවිසුම අත්සන් කරන ලදී. |
| 2023 මාර්තු 30 | - | උපරිම ණය සීමාව රුපියල් 400,000 දක්වා වැඩි කරන අතරම, සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් 2023 ජූනි 30න් පසු උප ණය ලබා දීම වැළැක්වීම සඳහා කුඩා තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතියෙ හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2023 අගෝස්තු 10 | - | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල් වැඩසටහනෙහි මෙහෙයුම් කාලය 2023 ජූලි 01 සිට 2025 ජූනි 30 දක්වා දීර්ඝ කිරීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සමඟ පරිපාලන ගිවිසුම අත්සන් කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 15 | - | 2023 අංක 16 දරන නව මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ සහ දේශීය කෘෂිකාර්මික නියමු ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු අවසන් කරන ලදී. |
| 2023 නොවැම්බර් 30 | - | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහයෝගීතාවයෙන්, ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් සඳහා “මනුසවි” ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීමට සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |

2024 ජනවාරි 03 - ඉදිරියේදී රජයේ අරමුදල් මගින් හෝ අරමුදල් සපයනු ලබන නියෝජිත ආයතනවල අරමුදල් භාවිතයෙන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. නමුදු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ණය යෝජනා ක්‍රමයන් හි මෙහෙයුම් කාලය අවසන් වනතෙක් එම ණය යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ඇත.

**ගෙවීම් හා පියවීම්**

2023 පෙබරවාරි 01 - විදේශීය රටක් හෝ අධිකාරියක් විසින් බලය පවරනු ලබන සහ නියාමනය කරනු ලබන ආයතන විසින් රටක් තුළ හෝ කලාපීයව ක්‍රියාත්මක වන ගෙවීම් ජාලයන් සමඟ සම්බන්ධ වීමට ශ්‍රී ලංකා මහ බැංකුව ලංකාපේ පෞද්ගලික සමාගම වෙත අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව ලංකාපේ ආයතනය, චීනයේ ස්ථාපිත සී/ස යූනියන්පේ ඉන්ටනැෂනල් සමාගම (UnionPay International Co. Ltd/UPI), සහ ඉන්දියාවේ ස්ථාපිත සී/ස NPCI ඉන්ටනැෂනල් පේමන්ට්ස් සමාගම (NPCI International Payments Ltd /NIPL) සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාව තුළදී LANKAQR ක්‍රමය හරහා චීන සහ ඉන්දියානු ජාතිකයින් විසින් ඔවුන්ගේ ගෙවීම් පසුම්බි වලින් සිදු කරන ගෙවීම් පිළිගැනීමට පහසුකම් සලසා දෙන ලදී. චීන සංචාරකයින් හට 2023 පෙබරවාරි සිට මෙම ක්‍රමය හරහා ගනුදෙනු කිරීමට හැකියාව ලැබුණි. එලෙසම ඉන්දියානු සංචාරකයින් හට 2024 පෙබරවාරි 12 දින සිට මෙම හැකියාව ලැබුණි.

2023 මැයි 08 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සේවා සපයන්නන් හරහා ක්‍රියාත්මක වන LANKAQR ගනුදෙනු සඳහා ගනුදෙනු මුදලින් උපරිම සියයට 1.8ක තනි වෙළඳ වට්ටම් අනුපාතිකයක් (Merchant Discount RateMDR) හඳුන්වා දෙන ලදී. දේශීය LANKAQR ගනුදෙනු සඳහා සියයට 0.5ක් වෙළඳ වට්ටම් අනුපාතිකය එලෙසම පවත්වාගෙන යන ලදී.

2023 ජූලි 20 - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) හරහා සිදු කරන ලද ගනුදෙනු වල ප්‍රමාණය සහ වටිනාකම වර්ධනය වීමත් සමග එයට පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා වූ බහු-ස්ථර වගකීම්

කළමනාකරණ සීමා ව්‍යුහය සංශෝධනය කරන ලදී.

| | | |
|---|---|---|
| 2023 අගෝස්තු 31 | - | ගෙවීම් පිළිවෙත් සහ සේවා සම්බන්ධ අනාරක්ෂිත, අසත්‍ය හෝ අසාධාරණ භාවිතයන් පිළිබඳව මහජනතාවගෙන් තොරතුරු එක්රැස් කිරීම සඳහා ත්‍රෛ භාෂා වෙබ් පිටුවක් හඳුන්වා දෙන ලදී. |
| 2023 දෙසැම්බර් 29 | - | ඩිජිටල් ගනුදෙනු මාධ්‍යයන් භාවිතය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා ලංකාපේ මාර්ගගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform), ඍජු හර සේවාව (Direct Debit), ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වන හවුල් යාන්ත්‍රණය (Shared KYC facility) සහ රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව (Government Digital Payment Platform) වැනි නවෝත්පාදන සඳහා එක්වීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වලට අනිවාර්ය කරන ලදී. ඊට අමතරව ගනුදෙනුකරුවෙකුගේ ණය සහ හර ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම් දීම් සක්‍රීය කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් ගනුදෙනු ප්‍රචලිත කිරීම, ඩිජිටල් මාධ්‍යයන් හරහා සිදු කෙරෙන ණය කාඩ්පත් පියවීම් එසැණින් යාවත්කාලීන කිරීම, ඩිජිටල් ගනුදෙනුවක් සිදු කිරීමේදී ප්‍රතිලාභියා වෙත යැවෙන විස්තරය (reference field) අනිවාර්ය කිරීම වැනි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුනාගත් අනෙකුත් ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් ද බලපත්‍රලාභී බැංකු වලට අනිවාර්ය කරන ලදී. තවද, මූල්‍ය අත්පත්කරුවන් ලෙස ක්‍රියාකරන බලපත්‍රලාභී බැංකු වලට වෙළඳ වට්ටම් අනුපාතය ඔවුන්ගේ වෙළඳුන් විසින් ගනුදෙනුකරුවන්ගෙන් අය කර නොගන්නා ලෙස උපදෙස් දෙන ලෙස දැනුම් දෙන ලදී. |
| | - | විද්‍යුත් මුදල් පසුම්බි හරහා සිදු කෙරෙන ඩිජිටල් ගනුදෙනු සමඟ විදේශ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමට වැඩි දියුණු කරන ලද (enhanced) සහ මූලික (basic) විද්‍යුත් මුදල් පසුම්බියක රු. 50,000 සහ රු. 10,000 යන සීමාවන් පිළිවෙලින් රු. 150,000 සහ රු. 20,000 දක්වා 2024 ජනවාරි 01 දින සිට ඉහළ දමන ලදී. |
| 2024 ජනවාරි 17 | - | ජස්ට්පේ (JustPay) ගනුදෙනු සිදු කළ හැකි ජංගම ගෙවීම් යෙදුම් හරහා වඩාත් සුරක්ෂිතව සහ ආරක්ෂාකාරීව ගනුදෙනු කිරීම සඳහා පහසුකම් සැලසීමට 2024 ජනවාරි 01 වැනි දින සිට ගනුදෙනුවක වටිනාකම රු. 10,000 ට සමාන හෝ ඊට වැඩි නම්, ජස්ට්පේ ගනුදෙනුව ආරම්භ කරන ජංගම ගෙවීම් යෙදුම් මගින් එම ජංගම ගෙවීම් යෙදුම හා සම්බන්ධ කර ඇති ගිණුම අයත් මූල්‍ය ආයතනයෙන් එක වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදයක් (OTP) ඉල්ලා සිටීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්ය |

| | | |
|---|---|---|
| | | කරන ලදී. ජස්ට්පේ ගනුදෙනු සිදු කළ හැකි ජංගම යෙදුම් පරිශීලකයන්ට ඕනෑම් මූල්‍ය ආයතනයක ඇති ඔවුන්ගේ ගිණුම් ජංගම ගෙවීම් යෙදුම්වලට සම්බන්ධ කිරීමට සහ එවැනි ගිණුම් වලින් අරමුදල් ලබාගැනීමෙන් ගෙවීම් සිදු කිරීමට හැකියාව ලබාදේ. |
| 2024 පෙබරවාරි 01 | - | NEPALPAY QR ජංගම යෙදුම හරහා නේපාල සංචාරකයින් සිදු කරන LANKAQR ගනුදෙනු පිළිගැනීම සඳහා ලංකාපේ පුද්ගලික ආයතනයට නේපාල නිෂ්කාශන ආයතනය හා සම්බන්ධ වීමට අනුමැතිය ලබාදෙන ලදී. |

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම**

| | | |
|---|---|---|
| 2023 මාර්තු 03 | - | අනුකූලතා අඩුපාඩු පිළිබඳ නිසි සුපරීක්ෂාවෙන් කටයුතු කරන ලෙස දැනුම්වත් කිරීම සඳහා සියලු බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත 2023 අංක 1 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 07 | - | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නිශ්චල දේපළ වෙළඳාම් අංශය සඳහා වන ආයතනික අනුකූලතාව පිළිබඳව නිශ්චල දේපළ වෙළඳාම් ආයතන වෙත 2023 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 13 | - | මූල්‍ය බුද්ධි ඒකකයේ goAML පද්ධතිය වෙත වාර්තාකරණ සීමාව ඉක්මවා සිදුකරන දේශීය විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ 2023 අංක 01 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| 2023 අගෝස්තු 07 | - | 2023 - 2028 අතර වසර 5ක කාලයකට අදාළව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2023 අගෝස්තු 22 | - | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත අනිවාර්යයෙන් ලබාදිය යුතු වාර්තා සම්බන්ධයෙන් පෙර නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ වාර්තා කිරීමේ ආකෘති පිළිපැදීම පිළිබඳ සිහිකැඳවීමක් ලෙස සියලු බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, බලපත්‍රලාභී රක්ෂණ සමාගම් සහ බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් වෙත 2023 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

2023 සැප්තැම්බර් 01 - මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් නීතිඥවරුන් සහ නොතාරිස්වරුන් සඳහා වන අනුකූලතාව පිළිබඳ 2023 අංක 02 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී

**විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු**

2023 ජනවාරි 26 - "අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම් - IIS යෝජනා ක්‍රමය" වෙනුවෙන් නිකුත් කළ මෙහෙයුම් උපදෙස් අවලංගු කිරීම.

- මහ බැංකුව විසින් පවත්වනු ලබන එ.ජ.ඩො./ ශ්‍රී.ලං.රු. ගැනුම්-විකිණුම් සහ විකිණුම්-ගැනුම්, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙන්දේසි සඳහා අදාළ වන මෙහෙයුම් උපදෙස් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත නිකුත් කිරීම.

2023 පෙබරවාරි 24 - 2023 පෙබරවාරි 27 වැනි දින සිට බලපැවෙත්වෙන පරිදි, දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත පදනම් වූ විදේශ විනිමය කටයුතු දිරිමත් කිරීම සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා අනිවාර්යයෙන් විකිණීමට අවශ්‍යව තිබූ රුපියල්වලට පරිවර්තනය කෙරෙන සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පරිවර්තනය කෙරෙන සේවා අපනයන ලැබීම්/ ආදායම් සහ අනිවාර්ය පදනම යටතේ පරිවර්තනය කරන ලද අපනයන ලැබීම්වලින් සියයට විසිපහක (25%) ප්‍රමාණය සියයට පහළොවක් (15%) දක්වා අඩුකිරීම.

2023 පෙබරවාරි 27 - ජංගම ගනුදෙනුවලට අදාළව අනාගතයේ සිදු කළ යුතු ගෙවීම් සහ විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් ණය පහසුකම් ආපසු ගෙවීම් වෙනුවෙන් යම් සමාගමකට (ආයෝජිත), ශ්‍රී ලංකාවට පිටත නේවාසික ආයෝජකයකු විසින් එකී සමාගමේ කොටස් ප්‍රාග්ධනයේ ආයෝජනය කිරීමෙන් හිමිවන ලැබීම් මගින් “ විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් - ආයෝජිත ” විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත 2023 අංක 01 දරන විධානය 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ප්‍රකාරව නිකුත් කරන ලදි.

2023 මාර්තු 03 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත 2022 මැයි 12 වන දින නිකුත් කරන ලද “විනිමය අනුපාතිකයේ දෛනිකව සිදුවන විචලනය කළමනාකරණය කිරීම” පිළිබඳ වූ මෙහෙයුම් උපදෙස් 2023 මාර්තු 07 වැනි දින සිට බලපැවෙත්වෙන පරිදි අවලංගු කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත 2021 ජනවාරි 27 නිකුත් කරන ලදුව, 2021 පෙබරවාරි 18 දින සංශෝධනය කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමය'' සහ ''අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම'' පිළිබඳ වූ මෙහෙයුම් උපදෙස් 2023 මාර්තු 07 දින සිට බලපැවෙත්වෙන පරිදි අවලංගු කිරීම.

2023 ජූනි 28 - 2022 ජූනි මස 30 දිනැති අංක 2286/27 සහ 2022 දෙසැම්බර් මස 22 දිනැති අංක 2311/38 දරණ අතිවිශෙෂ ගැසට් නිවේදන මගින් පළ කරන ලද නියමයන් අවලංගු කරමින් 2023 ජූනි මස 28 දින සිට ඉදිරි මාස 06 ක් දක්වා බලපැවැත්වෙන පරිදි, පනතෙහි 22 වැනි වගන්තිය යටතේ තෝරා ගත් ප්‍රාග්ධන ගනුදෙනු අත් හිටුවීම/ සීමා කිරීම සඳහා 2023 ජූනි මස 28 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදන අංක 2338/40 නිකුත් කරන ලදි.

2023 දෙසැම්බර් 04 - මුදල් පනතේ - 2019 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 1 (සංශෝධිත) ප්‍රකාරව දේශීය වෙළෙඳපළට භාණ්ඩ/ නිෂ්පාදන අලෙවි කිරීමට අවසර දී ඇති ව්‍යවසායකයින් 2021 අංක 5 දරන විධානයන්හි ඇමුණුම Iට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සංශෝධන කරමින් ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්වලට අදාළව 2023 අංක 02 දරන විධානයන් නිකුත් කරන ලදි.

- 2021 මාර්තු මස 18 දිනැති 2021 අංක 09 දරන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද විධානයන්ට සංශෝධනයක් වශයෙන්, මුදල් පනතේ - 2019 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 1 (සංශෝධිත) ප්‍රකාරව දේශීය වෙළෙඳපළට භාණ්ඩ/ නිෂ්පාදන අලෙවි කිරීමට අවසර දී ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටින ව්‍යවසායකයින්ට ගෙවීම් කිරීමට සහ භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ට, නැව්/ගුවන් සේවා නියෝජිතයින්ට භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් වන ගෙවීම් ව්‍යවහාර විදේශ මුදල් ගිණුම්වලට හෝ ඔවුන් විසින් අක්වෙරළ බැංකු ඒකකවල පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත මාරු කිරීමට අවසරය ලබා දෙමින් 2023 අංක 03 දරන විධානයන් නිකුත් කරන ලදි.

2023 දෙසැම්බර් 20 - 2023 ජූනි මස 28 දිනැති අංක 2338/40 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් පළ කරන ලද නියමය අවලංගු කරමින් 2023 දෙසැම්බර් මස 20 දින සිට ඉදිරි මාස 06ක් දක්වා බල පැවැත්වෙන පරිදි, පනතෙහි 22 වැනි වගන්තිය යටතේ තෝරා ගත් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා පැවති අත් හිටුවීම්/

සීමා කිරීම් ලිහිල් කරමින්, 2023 දෙසැම්බර් මස 20 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදන අංක 2363/26 නිකුත් කරන ලදි.

2024 ජනවාරි 01 - 2023 පෙබරවාරි මස 27 දිනැති 2023 අංක 01 දරන ජංගම ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම සඳහා වන "විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම- ආයෝජිත" විධානයන්හි වලංගු කාලය 2024 ජුනි මස 30 දක්වා දීර්ඝ කරමින් ඊට සම්බන්ධිත සංශෝධන ඇතුළත්ව 2024 අංක 01 දරන විධානයන් නිකුත් කරන ලදි.

2024 පෙබරවාරි 15 - මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) මගින් ක්‍රියාත්මක කරන සහ පවත්වාගෙන යන පද්ධති මත සුරැකුම්පත් ණයට ගැනීම සහ ණයට ලබාදීම (SBL) හරහා කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත ඕනෑම සුරැකුම්පත් නියාමනය කරන ලද හිඟ විකුණුම් (RSS) සඳහා පහසුකම් සැලසීමට 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද 2021 අංක 2 දරන නියෝග (සංශෝධිත පරිදි), 2024 පෙබරවාරි මස 15 දිනැති අංක 2371/33 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් තවදුරටත් සංශෝධනය කරන ලදී.

2024 පෙබරවාරි 16 - ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් වසර 3 ට අඩු ආපසු ගෙවීම් කාලයක් සහිතව ණය ලබාගැනීමේ පහසුකම අත්හිටුවීමට සහ දැනටමත් ලබාගෙන ඇති එවැනි ණය මුදල් ආපසු ගෙවීම සඳහා ණය ගැනුම්කරුවාට ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂයන්/මුදල් ප්‍රවාහයන් නොමැති අවස්ථාවක දී, ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් එම ණය මුදල් ආපසු ගෙවීම සඳහා පහසුකම් සැලසීමට, 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද 2021 අංක 2 දරන නියෝග (සංශෝධිත පරිදි), 2024 පෙබරවාරි මස 16 දිනැති අංක 2371/48 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් තවදුරටත් සංශෝධනය කරන ලදී.

- ආයෝජිතයා සතුව ප්‍රමාණවත් විදේශ විනිමය ඉපැයීම් නොමැති අවස්ථාවක දී ලැයිස්තුගත කොටස් සහ ලැයිස්තුගත ණය සුරැකුම්පත් වල ආදායම් (ලාභාංශ/පොළිය) සහ කල්පිරීමෙන් ලද මුදල් ගෙවීම සඳහා, 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පල කරන ලද 2021 අංක 2 දරන නියෝග (සංශෝධිත පරිදි), 2024 පෙබරවාරි මස 16 දරන දිනැති අංක 2371/49

දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් තවදුරටත් සංශෝධනය කරන ලදී.

- 2021 ජුනි මස 30 දිනැති අංක 2234/20 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද 2021 අංක 6 දරන නියෝග අවලංගු කරන ලද අතර එම නියෝග ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීමේ කාර්යය සඳහා විදේශයන්ගෙන් ලබාගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂයන්/මුදල් ප්‍රවාහයන් නොමැති අවස්ථාවක දී, ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් එම ණය මුදල් ආපසු ගෙවීම සඳහා පහසුකම් සැලසීමට 2024 පෙබරවාරි මස 16 දිනැති අංක 2371/50 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

2024 මාර්තු 20 - 2024 පෙබරවාරි මස 15 දිනැති අංක 2371/33 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් දක්වන ලද ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට අදාළ ඡේද ඇතුළත් කරමින් ආමුඛ ආයෝජන ගිණුම් සඳහා 2021 මාර්තු මස 18 දිනැති 2021 අංක 15 දරන විධාන, 2024 මාර්තු මස 20 දිනැති 2024 අංක 02 දරන විධාන මගින් සංශෝධනය කරන ලදී.

තවද, ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කරමින් ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් ගෙවීම සඳහා ආයෝජිතයන්ට හෝ නිකුත් කරන්නන්ට [ආමුඛ ආයෝජන ගිණුම් සඳහා වන විධාන වල 5 (ඇ) (ii) යටතේ අවසරලත් බැර කිරීම් යටතේ සිදුකරන ලද ආයෝජන (එනම් ආයෝජිතයාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත ආයෝජන අරමුදල් හුවමාරු කිරීම) සම්බන්ධයෙන්] අවසර ලබාදීමට 2021 අංක 15 දරන විධානවල ඡේදයක් 2024 අංක 2 දරන විධාන මගින් අවලංගු කරන ලදී.

- ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්හිමියන් හට විදේශීය ණය ලබාදෙන්නන්ගෙන් කෙටි කාලීන ණය ලබාගැනීමේ පහසුකම අවලංගු කිරීමට ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුහිමියන් සඳහා පහසුකම් ලබාගැනීම සඳහා වන 2021 අංක 9 දරන විධානයන්, 2024 අංක 3 දරන විධාන මගින් අවලංගු කරන ලදී.

2024 පෙබරවාරි මස 16 දිනැති අංක 2371/49 දරන රජයේ අතිවිශෙෂ ගැසට් නිවේදනයට අනුකූලව, කොළඹ කොටස් හුවමාරුවේ විදේශ ව්‍යවහාර මුදලින් නම් කරන ලද ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා

නිකුත් කරන ලද විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සඳහා වන 2021 ජූලි මස 30 දිනැති 2021 අංක 26 දරන විධානයන් සංශෝධනය කර 2024 අංක 4 දරන විධානයන් නිකුත් කරන ලදී.

**රාජ්‍ය ණය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2023 පෙබරවාරි 13 | - | සෘජු නිකුතු කවුළුව ඔස්සේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඉදිරිපත් කිරීම (offering) අත්හිටුවන ලදී. |
| 2023 මාර්තු 16 | - | "2023 අංක 1 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (තොරතුරු හෙළිදරව් කිරීම) නියෝග" නිකුත් කරන ලදී. |
| 2023 අප්‍රේල් 04 | - | භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දෙවන අදියර විවෘතව පවතින කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම සිදු වන අවස්ථා වලදී, අදාළ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දෙවන අදියර, එම භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය අවසන් වූ වහාම පැයක කාලයක් සඳහා හෝ එම වෙන්දේසි දිනයේ ව්‍යාපාර කටයුතු අවසානය දක්වා යන අවස්ථා දෙකෙන් දීර්ඝතම අවස්ථාව දක්වා විවෘතව තබනු ලැබේ |
| 2023 මැයි 12 | - | 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත ප්‍රකාරව, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සඳහා පවතින සීමාව රුපියල් බිලියන 5,000 සිට රුපියල් බිලියන 6,000 දක්වා ඉහළ නැංවීමට කරන ලද යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |
| 2023 ජුනි 19 | - | 2023 ජුනි 19 වැනි දින අදාළ විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ, අන්තර්ජාලය මත පදනම් වූ නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ පද්ධතිය 2023 ජුනි 21 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදී. |
| 2023 ජූලි 04 | - | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති ණය තිරසරභාවය පිළිබඳ ඉලක්ක සපුරා ගැනීමට දායක වීම සඳහා, විස්තීරණ ණය පහසුකමට අනුකූලව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ දේශීය ණය ප්‍රශස්තකරණය (Domestic Debt Optimisation / DDO) පිළිබඳව රජයේ ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය සමන්විත වන්නේ,<br>(අ) 1937 අංක 7 දරන (සංශෝධිත) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කර ඇති භාණ්ඩාගාර |

බැඳුම්කර, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කර ගැනීම සඳහා වූ ආරාධනය යටතේ (භාණ්ඩාගාර බැඳුම්කර සඳහා හුවමාරු යෝජනාව) ප්‍රකාශයට පත් කර ඇති ආකාරයට ඇතැම් සුදුසුකම්ලත් භාණ්ඩාගාර බැඳුම්කර හිමිකරුවන් සඳහා, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කිරීමට නියමිත නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම/හුවමාරු කිරීම.

(ආ) 1923 අංක 8 දරන (සංශෝධිත) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුව හිමිකාරීත්වය දරන භාණ්ඩාගාර බිල්පත්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (සංශෝධිත) යටතේ නිකුත් කිරීමට නියමිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට ලබා දී ඇති තාවකාලික අත්තිකාරම්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (සංශෝධිත) යටතේ නිකුත් කිරීමට නියමිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම.

(ඈ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු කර ගැනීම සඳහා වූ ආරාධනය යටතේ (ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාව) 1957 අංක 29 දරන විදේශ ණය පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, 1937 අංක 7 දරන (සංශෝධිත) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කිරීමට නියමිත ශ්‍රී ලංකා රුපියල් හෝ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර බවට හුවමාරු කිරීම සහ දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් මගින් නාමනය කරන ලද රජයේ බැංකු ණය ප්‍රතිව්‍යුහගත කිරීම.

2023 ජූලි 19 - භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවෙහි දක්වා ඇති භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු ආරාධනයෙහි කල් ඉකුත්වන දිනය, නිවේදන දිනය සහ පියවීමේ දිනය පිළිවෙලින් 2023 අගෝස්තු 11, 2023 අගෝස්තු 16 හෝ ඊට ආසන්න දිනකදී සහ 2023 අගෝස්තු 17 දක්වා දීර්ඝ කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවෙහි දක්වා ඇති හුවමාරුව සඳහා වන ආරාධනයේ, පියවීමේ දිනය 2023 අගෝස්තු 15 දින දක්වා දීර්ඝ කරන ලදී.

2023 අගෝස්තු 11 - භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවෙහි දක්වා ඇති භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු ආරාධනයෙහි කල් ඉකුත්වන දිනය, නිවේදන දිනය සහ පියවීමේ දිනය පිළිවෙළින් 2023 අගෝස්තු 28, 2023 අගෝස්තු 29 හෝ ඊට ආසන්න දිනකදී සහ 2023 අගෝස්තු 31 දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී.

2023 අගෝස්තු 15 - දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවට අනුව, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරුව පියවීම 2023 අගෝස්තු 15 වන දිනයේදී සිදු කරන ලදී. ශ්‍රී ලංකා රුපියල් වලින් නාමනය කරන ලද රුපියල් බැඳුම්කර සඳහා ඉල්ලුම් කරන ලද, සුදුසුකම් ලත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හිමියන්ට රුපියල් බිලියන 252.2ක වටිනාකමකින් යුතු රුපියල් බැඳුම්කර වෙන් කරන ලදී. තවද, එම ආයෝජකයන්ට අදාළ උපචිත සහ හිඟ පොලී, ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවන ලදී.

2023 අගෝස්තු 21 - 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2(1)(ආ) වගන්තියේ දක්වා තිබූ රුපියල් බිලියන 4,979ක් වූ රජයේ ණය ගැනීමේ උපරිම සීමාව, රුපියල් බිලියන 13,979ක් ලෙස සංශෝධනය කිරීම සඳහා වන විසර්ජන (සංශෝධිත) කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

2023 අගෝස්තු 25 - භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවෙහි දක්වා ඇති භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු ආරාධනයෙහි කල් ඉකුත්වන දිනය, නිවේදන දිනය සහ පියවීමේ දිනය පිළිවෙළින් 2023 සැප්තැම්බර් 11, 2023 සැප්තැම්බර් 12 හෝ ඊට ආසන්න දිනකදී සහ 2023 සැප්තැම්බර් 14 දක්වා තවදුරටත් දීර්ඝ කරන ලද අතර, 2023 සැප්තැම්බර් 01 දින කල් පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර දෙකක් සුදුසුකම් ලත් බැඳුම්කර ලැයිස්තුවෙන් බැහැර කරන ලදී.

2023 සැප්තැම්බර් 14 - දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ හුවමාරු යෝජනාවට අනුව, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව පියවීම සිදු කරන ලදී. පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර, දිගු කල්පිරීම් සහිත රුපියල් බිලියන 3,204.5ක් වූ නව බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. තවද, ආයෝජකයින්ට ඔවුන්ගේ

| | | |
|---|---|---|
| | | පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රුපියල් බිලියන 110.9ක උපචිත පොලියක් ගෙවන ලදී |
| 2023 සැප්තැම්බර් 20 | - | 2023 සැප්තැම්බර් 20 දින අදාළ විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අන්තර්ජාලය මත පදනම් වූ සෘජු නිකුතු කවුළුවක් 2023 සැප්තැම්බර් 25 වන දින සිට ක්‍රියාත්මක කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 21 | - | 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අංක 129(2) වගන්තියට අනුව සහ 2023 අංක 12 දරන විසර්ජන පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට දුන් නොපියවූ තාවකාලික අත්තිකාරම් රුපියල් බිලියන 344.7 ක් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් මිලදී ගත් නොපියවූ භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 2,368.4ක් අතුරින් රුපියල් බිලියන 2,492.3ක්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන්වලින් යුතු නව භාණ්ඩාගාර බැඳුම්කර 10ක් බවට සහ රුපියල් බිලියන 220.8ක්, එවකට වෙළෙඳපොළෙහි පැවති භාණ්ඩාගාර බිල්පත් 12ක් බවට පරිවර්තනය කර 2023 සැප්තැම්බර් මස 21 දින පියවන ලදී. |
| 2023 නොවැම්බර් 03 | - | 2023 අගෝස්තු 18 වන දින අත්සන් කරන ලද මහජන බැංකුවේ අක්වෙරළ බැංකු ඒකක ණය ශේෂය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ අවබෝධතා ගිවිසුමට අනුව, දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ අක්වෙරළ බැංකු ඒකක ණය හුවමාරුව එම බැංකුව සඳහා ක්‍රියාත්මක කරන ලදී. එම ණය මුදල වන රුපියල් බිලියන 27.7ක් වෙනුවෙන් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර 5ක් වෙන් කරන ලදී. |
| 2024 මාර්තු 11 | | 2024 මාර්තු 07 දින අදාළ සංශෝධිත විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දෙවන අදියර සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, වෙන්දේසියේ සමස්ත හිඟය හා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ සමස්ත වටිනාකමින් සියයට 10ක් හෝ රුපියල් බිලියන 5ක් යන ද්විත්වයෙන් ඉහළ අගයක් ගන්නා ප්‍රමාණය ලෙස අඩු කරන ලද අතර 2024 මාර්තු 11 දින සිට මෙම විධානය බලාත්මක කරන ලදී<br>2024 මාර්තු 07 දින අදාළ සංශෝධිත විධාන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ භාණ්ඩාගාර බැඳුම්කරවල සෘජු නිකුතු කවුළුව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේදී සම්පූර්ණයෙන් ම පිළිගනු ලබන සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා ඉදිරිපත් කළ |

මුදලින් සියයට 10ක් දක්වා අඩු කරන ලද අතර, 2024 මාර්තු 11 දින සිට මෙම විධානය බලාත්මක කරන ලදී.

**මූල්‍ය අංශය**

**බලපත්‍රලාභී බැංකු**

2023 ජනවාරි 02 - 2023 ජනවාරි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, අත්තිකාරම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පොලී අනුපාතිකය, එනම් බැංකු අනුපාතිකය, මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කර ඇති නවතම බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (Average Weighted New Deposit Rate) මත පදනම් අංක +300 ආන්තිකයක් එකතු කොට තීරණය කරනු ලබන බව නිවේදනය කරන ලදී.

2023 ජනවාරි 31 - බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (බලපත්‍රලාභී බැංකුවල) ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේදී, සුදුසුකම් ලත් මූල්‍ය නොවන සාංගමික ණය සුරැකුම්පත් සහ සුදුසුකම් ලත් මූල්‍ය නොවන සාමාන්‍ය කොටස් යන උපකරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති බාසල් III ද්‍රවශීලතා ආවරණ අනුපාතය සඳහා වන විධාන වල කොන්දේසි වලට යටත්ව ද්‍රවශීල වත්කම් ලෙස සැලකීමට අවසර ලබා දෙමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී.

2023 පෙබරවාරි 02 - පවත්නා සාර්ව ආර්ථික තත්ත්වයන් සහ බලපත්‍රලාභී බැංකුවල තිරසාර බව සහතික කිරීම සඳහා සුදුසු මට්ටමේ ද්‍රවශීලතාවයක් සහ ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කරමින් බැංකු පනත යටතේ විධාන නිකුත් කරන ලදී.

2023 පෙබරවාරි 16 - භාණ්ඩ ආනයනයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරනු ලබන ණයවර ලිපි මත සියයට සියයක මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව 2022 මැයි මස 19 දිනැති නියෝගයේ සඳහන් සංයෝජිත වර්ගීකරණ කේත යටතේ වූ භාණ්ඩ ලැයිස්තුවට අමතරව, නව සංයෝජිත වර්ගීකරණ කේත (HS Code) 64 ක් සඳහා පනවන ලදී.

2023 පෙබරවාරි 17 - නව සංයෝජිත වර්ගීකරණ අංක 64ක් සඳහා 2022 අංක 03 දරන ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා යන බැංකු පනත් විධානයෙහි විධිවිධාන අදාළ කරමින්, එම බැංකු පනත් විධානය සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 2023 මාර්තු 07 | - | තම ව්‍යාපාර/ආදායම් මාර්ග පුනර්ජීවනය කිරීමට විභවතාවක් ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් දිරිමත් කිරීමේ අරමුණින් බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් වෙත අවස්ථානුකූලව සුදුසු සහන සලසන ලෙස බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින ලදී. |
| 2023 අප්‍රේල් 21 | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් දැනුම් දුන් පරිදි, 2023 ජනවාරි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි, අයි.සී.ආර්.ඒ ලංකා ලිමිටඩ් ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළ නතර කිරීම හේතුවෙන්, බලපත්‍රලාභී බැංකුවලට අදාළ නියාමන කටයුතු සඳහා සුදුසුකම් ලත්/පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස අයි.සී.ආර්.ඒ ලංකා ලිමිටඩ් ආයතනය පිළිගැනීම අත්හිටුවන ලෙස දන්වා බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2023 අප්‍රේල් 25 | - | බලපත්‍රලාභී බැංකු වල අභිමතානුරූපී ගෙවීම් සීමා කිරීම පිළිබඳ 2023 අංක 01 දරන බැංකු පනත් විධානයට සංශෝධනයක් නිකුත් කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් විධානයේ දක්වන ලද අවශ්‍යතා සපුරාලීමෙන් තොරව ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වන කළමනාකරණ දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩල ගෙවීම් ඉහළ දැමීමෙන් වැළකිය යුතු වේ. |
| 2023 මැයි 17 | - | ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යෑම පිළිබඳව 2022 මැයි මස 19 සහ 2023 පෙබරවාරි මස 16 දින නිකුත් කරනු ලැබූ නියෝග අහෝසි කරන ලදී. |
| 2023 මැයි 18 | - | ආනයන වලට එරෙහි ආන්තික අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022 අංක 03 දරන බැංකු පනත් විධානය සහ 2023 අංක 02 දරන බැංකු පනත් විධානය අවලංගු කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2023 අගෝස්තු 25 | - | බලපත්‍රලාභී බැංකුවල ඇතැම් ශ්‍රී ලංකා රුපියල් ණය සඳහා උපරිම පොලී අනුපාත පනවමින් සහ අනෙකුත් සියලුම නව සහ පවතින රුපියල් ණය වල පොලී අනුපාත ඉලක්කගත දිනයන්හිදී නිශ්චිත ප්‍රතිශත වලින් අඩු කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කරමින් ශ්‍රී ලංකා රුපියල් ණය සඳහා වන පොලී අනුපාත යන මැයෙන් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. තවද, දඩ පොලී අනුපාතය වාර්ෂිකව සියයට 2 නොඉක්මවන මට්ටමකට අඩු කරන ලෙස ද බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින ලදී. |

| | | |
|---|---|---|
| 2023 නොවැම්බර් 15 | - | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත, පාර්ලිමේන්තුව විසින් 2023 සැප්තැම්බර් 14 දින සහතික කරන ලද අතර, අංක 2358/46 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගය අනුව, ඉහත සඳහන් පනතේ විධිවිධාන 2023 නොවැම්බර් 15 සිට ක්‍රියාත්මක විය. |
| | - | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ නියෝගයන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 23 | - | 2024 සහ 2025 වසර සඳහා අදාළ වන නව බලපත්‍ර ගාස්තු ව්‍යුහය දන්වමින් වාර්ෂික බලපත්‍ර ගාස්තු පිළිබඳ බැංකු පනත් නිර්ණයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2023 නොවැම්බර් 27 | - | 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කරන ලද නිර්ණයන් අංක 2360/02 ගැසට් නිවේදනය යටතේ සාමාන්‍ය ජනතාව වෙත නිකුත් කරන ලදී. |
| 2023 දෙසැම්බර් 08 | - | තෙවන පාර්ශවීය සේවා සපයන්නන් ලෙස හඳුනාගැනීම සඳහා වන අවශ්‍යතා, තීරණාත්මක තොරතුරු පද්ධති හඳුනා ගැනීම, පරිශීලක ප්‍රවේශ වරප්‍රසාද සමාලෝචන වාර ගණන, තොරතුරු පද්ධති යටිතල පහසුකම් වල හිමිකාරිත්වය හා කළමනාකරණය තීරණය කිරිම සඳහා නිර්ණායක වැනි දෑ සංශෝධනය කරමින් බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව සම්බන්ධයෙන් වූ 2021 අංක 16 දරන බැංකු පනත් විධානය සඳහා සංශෝධන නිකුත් කරන ලදී. තවද, පැවති අසාමාන්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, අනුකූල වීමේ පොදු කාල සීමාව සහ ඇතැම් අනුකූල වීම් සඳහා වන සුවිශේෂ කාල සීමා දීර්ඝ කරන ලදී. |
| 2024 පෙබරවාරි 29 | - | ප්‍රයිස්වෝටර්හවුස්කූපර් සහ එස් ජේ එම් එස් ඇසෝසියේට්ස් යන විගණන ආයතනවල නම් වෙනස් කිරීමත් සමඟ එම විගණන ආයතනවල නම් පිළිවෙලින්, ඩෙලොයිට් පාර්ට්නර්ස් සහ ඩෙලොයිට් ඇසෝසියේට්ස් ලෙස වෙනස් කරමින්, 2019 අංක 08 දරන "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ගිණුම් ප්‍රකාශ විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකයින්ගේ ලැයිස්තුව" යන චක්‍රලේඛයට සංශෝධන නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2024 මාර්තු 25 | | සිදුවිය හැකි ණය සංකේන්ද්‍රණ අවදානම අවම කරමින් බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව, ශක්තිමත්භාවය සහ මහජන විශ්වාසය තහවුරු කිරීමේ අරමුණින්, 2026 ජනවාරි 01 වැනි දින සිට බලාත්මක කිරීමට නියමිතව, බලපත්‍රලාභී බැංකුවල "විශාල ගනුදෙනු නිරාවරණයවීම්" පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2024 මාර්තු 28 | - | දැනටමත් බලපත්‍රලාභී බැංකුවල ස්ථාපිත පශ්චාත් කොවිඩ්-19 යළි පණගැන්වීමේ ඒකක තවදුරටත් ශක්තිමත් කරමින් සහ එම ඒකක ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක ලෙස වැඩිදියුණු කරමින්, සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට පත් ව්‍යාපාර තිරසාර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් සහ බලපත්‍රලාභී බැංකු වල ඉහළ ගිය අක්‍රීය ණය නිසි ලෙස හැසිරවීම සහතික කිරීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | බැංකු (සංශෝධන) පනත<br>ආයතනික යහපාලනය පිළිබඳ සංශෝධිත විධාන |

**බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්**

| | | |
|---|---|---|
| 2023 ජනවාරි 05 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2023 ජනවාරි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2023 ජනවාරි 18 | - | ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි කිරීම, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි 9.1. (ඌ) වගන්තිය ප්‍රකාරව අවලංගු කරන ලදී. |
| 2023 ජනවාරි 31 | - | බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ (ඒකාබද්ධකරණ වැඩපිළිවෙල) කොටසක් ලෙස එල්ඕඑල්සී |

ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත (මුදල් ව්‍යාපාර පනත) යටතේ නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කරන ලදී. තවද, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත (කල්බදු මූල්‍යකරණ පනත) යටතේ එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී වෙත නිකුත් කර තිබූ ලියාපදිංචි කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවලංගු කරන ලදී.

- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම තුළින් අවිනිශ්චිත කාල වකවානු තුළ ඇති විය හැකි ආර්ථික කම්පන අවශෝෂණය සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වල ඔරොත්තු දීමේ හැකියාව සහ ධාරිතාව ශක්තිමත් කිරීමේ පියවරක් වශයෙන් සහ ගනුදෙනුකරුවන්ගේ ණය අවශ්‍යතා සඳහා අඛණ්ඩව සහාය වීම සඳහා, ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී.

2023 පෙබරවාරි 02 - නිශ්චිත කාර්යයන් සඳහා පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස ක්‍රියා කිරීමෙන් ඉක්රා ලංකා ලිමිටඩ් ආයතනය ඉවත් කර ඇති බව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී.

2023 පෙබරවාරි 08 - ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 ජූලි 25 දින බලපත්‍රය අවලංගු කරන ලද ද ස්ටෑන්ඩඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී.

2023 මාර්තු 03 - පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ පුද්ගලයන් සඳහා සුදුසු සහන ලබා දෙන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී.

2023 මාර්තු 21 - ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2020 මැයි 22 දින බලපත්‍රය අවලංගු කරන ලද ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී.

| | | |
|---|---|---|
| 2023 අප්‍රේල් 25 | - | 2023 අප්‍රේල් 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනතේ 37 (1) වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමේ නිවේදනයක් බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 09 | - | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 මාර්තු 05 දින බලපත්‍රය අවලංගු කරන ලද සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, ඈවරකරුවෙකු පත් කිරීමට කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2023 ජූලි 05 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2023 ජූලි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2023 ජූලි 31 | - | ඒකාබද්ධකරණ වැඩපිළිවෙලෙහි කොටසක් ලෙස, 2023 ජූලි 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වී ඇති අතර එම ඒකාබද්ධ වීමෙන් අනතුරුව පවතින ආයතනය නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී වේ. |
| 2023 සැප්තැම්බර් 01 | - | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය මුහුණ දී තිබූ බරපතල තත්ත්වය මගහරවා ගනිමින් සෑහීමකට පත්විය හැකි ප්‍රගතියක් පෙන්වීමට අපොහොසත් වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි 2023 සැප්තැම්බර් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එම ආයතනය වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය අවලංගු කරන ලදී. |
| 2023 දෙසැම්බර් 15 | - | මුදල් ව්‍යාපාර පනත යටතේ ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයට, අධිකරණයේ අධීක්‍ෂණයට යටත්ව ඈවරකරුවෙකු පත් කිරීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී. |
| 2024 ජනවාරි 05 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් |

| | | |
|---|---|---|
| | | ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2024 ජනවාරි 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2024 පෙබරවාරි 13 | - | බලපත්‍රලාභී මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව දැන ගැනීම සඳහා හෝ වෙනත් නිශ්චිත අරමුණක් සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාලෝචිත, නිවැරදි, ස්ථාවර සහ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණ ඇතිව කාලානුරූප වාර්තාකරණ අවශ්‍යතා පිළිබඳව උපදෙස් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | කුඩා සහ මධ්‍ය පරිමාණයේ බලපත්‍රලාභී මුදල් සමාගම්වල දිගු කාලීන තිරසරභාවය තහවුරු කිරීම සඳහා වන ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ II වන අදියර ක්‍රියාත්මක කිරීම. |
| | - | මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන ඇතුළුව, වර්තමාන වෙළඳපොළ ප්‍රවණතා සමඟ අනුකූලවන පරිදි පවත්නා නියාමන රාමුව සංශෝධනය කිරීම. |
| | - | අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කරන අතරතුර බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ස්ථායීභාවය වැඩිදියුණු කිරීමට අදාළ නීති සහ රෙගුලාසි හඳුන්වා දීම. |

**රක්ෂණය[2]**

| | | |
|---|---|---|
| 2023 අප්‍රේල් 24 | - | රක්ෂණ ඔප්පු හිමියන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ පිරිනමන සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදනයන්ගේ (General Insurance Products) රක්ෂණ ඔප්පු ලේඛනවල අත්‍යවශ්‍ය සංරචක සඳහා රාමුවක් සැකසීමට මාර්ගෝපදේශයක් නිකුත් කරන ලදී. |
| 2023 ජූනි 19 | - | හිමිකම් පෑමේදී මෝටර් රථ රක්ෂණ ඔප්පුවල සාමාන්‍ය තත්ත්වය සම්බන්ධයෙන් සාමාන්‍ය රක්ෂණ සමාගම්වල වත්මන් භාවිතයන් සැලකිල්ලට ගනිමින් සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත 2023 අංක 01 දරන නියෝගය නිකුත් කරන ලදී. |
| 2023 ජූලි 25 | - | 2023 අංක 01 දරන නියෝගයේ අයිතම අංක 1හි ඇතුළත් වචන ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පැහැදිලි කිරීමක් නිකුත් කරන ලදී. |

[2] ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වේ.

| | | |
|---|---|---|
| 2023 ජූලි 27 | - | 2021 දෙසැම්බර් 16 දිනැති 2021 අංක 05 දරන නියෝගය සහ 2017 දෙසැම්බර් 04 දිනැති 2017 අංක 12 දරන නියෝගය ප්‍රතිස්ථාපනය කරමින්, රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ප්‍රධාන නිලධාරීන් පිළිබඳ වූ 2023 අංක 02 දරන නියෝගය නිකුත් කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 01 | - | 2000 අංක 43 දරන රක්ෂණ සමාගම් නියාමන පනතෙහි 33 ආ(1) වගන්තියට අනුකූලව රක්ෂණකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍රය සහ දිවුරුම් ප්‍රකාශ සංශෝධනය කිරීමට නිර්ණ අංක 13 සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 09 | - | සංචාරක රක්ෂණ, සමුද්‍ර රක්ෂණ, හිමිකම් රක්ෂණ සහ කෙටි කාලීන සාමාන්‍ය රක්ෂණ ඔප්පුවල වාරික ගෙවීම සඳහා ණය ලබා නොදෙන පදනම මත රක්ෂණ සමාගම් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා වන වාරික ගෙවීමේ වගකීම් වගන්තියේ පවතින අදාළත්වය ඉවත් කිරීමේ අරමුණින්, අංක 25 දරන චක්‍රලේඛය සංශෝධනය කරමින්, 2023 අංක 1 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2023 සැප්තැම්බර් 27 | - | අවලංගු කරන ලද 2002 ඔක්තෝබර් 30 දිනැති අංක 07, 2008 පෙබරවාරි 08 දිනැති අංක 08 සහ 2018 අගෝස්තු 13 දිනැති අංක 09 දරන නිර්ණයන් වෙනුවට 2023 සැප්තැම්බර් 25 දිනැති අංක 07, 08 සහ 09 දරන නිර්ණයන් නිකුත් කරන ලදී. |
| 2024 ජනවාරි 08 | - | අංක 30 සහ අංක 35 දරන චක්‍රලේඛ අවලංගු කර එහි අවශ්‍යතා ඒකාබද්ධ කරමින් 2024 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2024 ජනවාරි 09 | - | වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල නොවීම සහ රක්ෂණ සමාගම් නියාමන පනතෙහි විධිවිධානවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් අංක 41 දරන චක්‍රලේඛය අවලංගු කරමින් 2024 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2024 පෙබරවාරි 01 | - | දායාද ජීවිත රක්ෂණ ඔප්පුවල (Endowment policies) අවම කාල පරිච්ඡේදය සීමා කිරීම සඳහා 2024 අංක 01 දරන නියෝගය නිකුත් කරන ලදී. |
| 2024 පෙබරවාරි 08 | - | 2016 අප්‍රේල් 07 දිනැති ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ ලිපියේ 4 වැනි ඡේදයට අනුව, අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයට (SLII) සත්‍යාපනය කොට තහවුරු කර නොමැති පුද්ගලයන්ගේ නියෝජිතායතන ගිවිසුම් අවලංගු කරන ලෙස දන්වමින්, සියලුම රක්ෂණකරුවන්ට සහ තැරැව්කරුවන්ට 2024 අංක 02 දරන නියෝගය නිකුත් කරන ලදී. |

**ප්‍රාග්ධන වෙළඳපොළ**[3]

| | | |
|---|---|---|
| 2023 ජනවාරි | - | ආයතනික ණය සුරැකුම්පත් මත නැවත මිලදී ගැනීමේ ගිවිසුම් (REPO) ගනුදෙනුවලට අදාළ සංශෝධිත ගනුදෙනු ගාස්තු පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් රෙගුලාසි නිකුත් කරන ලදී. |
| 2023 අප්‍රේල් | - | යටිතල පහසුකම් සම්බන්ධ නව නිෂ්පාදන (New products) වෙළඳපොළට හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා ගන්නා ලදී. |
| | | හරිත බැඳුම්කර සක්‍රීය කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් නීති සකස් කිරීම අවසන් කරන ලදී. |
| 2023 මැයි | - | කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින්, සුකුක් (Sukuk) නිෂ්පාදන සක්‍රීය කිරීම සඳහා නීති සකස් කිරීම අවසන් කරන ලද අතර, එම නීති කොන්දේසි සහිතව අනුමත කරන ලදී. |
| 2023 ජූනි | - | ඉහළ ඵලදා සහිත ආයතනික බැඳුම්කර හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා ගන්නා ලදී. |
| | - | නියාමනය කරන ලද කෙටි විකුණුම් (Regulated short selling) සහ සුරැකුම්පත් ණයට ගැනීම සහ ණයට දීම සඳහා වන නීති කොන්දේසි සහිතව අනුමත කරන ලදී. |
| 2023 අගෝස්තු | - | කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම්වලට XBRL වාර්තාකරණය හඳුන්වා දීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. |
| 2023 සැප්තැම්බර් | - | කොළඹ කොටස් හුවමාරුව විසින් යෝජනා කර ඇති පරිදි, ආයතනික ණය ගනුදෙනු සඳහා අදාළ වන ගනුදෙනු ගාස්තු, ගනුදෙනු වටිනාකමින් පදනම් අංක 1ක් දක්වා අඩු කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදී. |
| 2023 ඔක්තෝබර් | - | කොළඹ කොටස් හුවමාරුව විසින්, නිල් බැඳුම්කර (Blue bonds) සක්‍රීය කිරීම සඳහා වන නියාමන රාමුව සකස් කර අවසන් කරන ලද අතර ඒ සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. |
| 2023 නොවැම්බර් | - | ෂරියා අධීක්ෂණ කමිටුව (Sharia Supervisory Committee) හඳුන්වාදීම සඳහා නිර්දේශ නියමයන් (Terms of Reference) සකස් කර අවසන් කර ඇති අතර අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත. |
| | - | සුරැකුම්පත් ණය ගැනීම් සහ ණය දීම් හරහා නියාමනය කරන ලද කෙටි විකුණුම්, කොළඹ කොටස් හුවමාරුව විසින් දියත් කරන ලදී. |

[3] සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වේ.

| | | |
|---|---|---|
| 2023 දෙසැම්බර් | - | 2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ, සුකුක් (Sukuk) නිෂ්පාදනවල ෂරියා අනුකූලතාවය සහතික කළ හැකි පිළිගත් ෂරියා විද්වතුන් (Shariah Scholars) "අතිරේක සේවා සපයන්නන්" ලෙස හඳුනා ගන්නා ලදී. |
| 2024 ජනවාරි | - | ෂරියා අනුකූල ණය සුරැකුම්පත් සම්බන්ධ නීති සැකසීම අවසන් කරන ලද අතර ෂරියා විද්වතුන් (Shariah Scholars) සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කරන ලදී. |
| | - | කොළඹ කොටස් හුවමාරුවෙහි යටිතල පහසුකම් බැඳුම්කර නිකුත් කිරීම සහ ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම සඳහා වන නියාමන රාමුව සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. |

**මූල්‍ය අංශයට අදාළ වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග**

| | | |
|---|---|---|
| 2023 අගෝස්තු 08 | - | මූල්‍ය සේවා සපයන්නන්ගේ සාධාරණ, විනිවිදභාවයෙන් යුතු සහ සාදාචාරාත්මක ව්‍යාපාරකරණය ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන වෙළෙඳපොළ අධීක්ෂණය සහ බලගැන්වීම සිදුකිරීමට අවශ්‍ය පදනම සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය කරනු ලබන ආයතන සඳහා 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10(ඇ) වගන්තිය යටතේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි නිකුත් කරන ලදී. |
| 2024 | - | ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ලෝක බැංකුවේ මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ණය ගිවිසුම් අත්සන් කරන ලදී:<br>• 2024 ජනවාරි 31- ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අතර අත්සන් කරන ලද මූල්‍ය ගිවිසුම<br>• 2024 පෙබරවාරි 01 - ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුම<br>• 2024 පෙබරවාරි 06 - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද අනුබද්ධ ගිවිසුම |

**ආනයන සහ අපනයන පාලන**

2023 ජනවාරි 01 - ආනයන පාලන බලපත්‍රයක් මත ආනයනය කළ යුතු භාණ්ඩ ලැයිස්තුවක් සහ නැවත දැනුම් දෙන තුරු ආනයන පාලන බලපත්‍රයක් නිකුත් කිරීම අත්හිටුවන ලද තෝරාගත් අයිතම සඳහා ඒකාබද්ද ලැයිස්තුවක් 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි (අංක 2312/77 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

- තෝරාගත් ආනයන භාණ්ඩ තාවකාලික අත්හිටුවීමට සහ අදාළ බලධාරීන්ගේ අනුමැතිය සහිත ව නිදහස් කිරීම් සඳහා හඳුන්වා දී ඇති නියමයන් ඇතුලත් ඒකාබද්ද ආනයන භාණ්ඩ ලැයිස්තුවක් සහිත ව 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2312/78 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

2023 ජනවාරි 19 - විවෘත ගිණුම් ක්‍රම හෝ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යටතේ ශ්‍රී ලංකාවේ වරාය හෝ ගුවන් තොටුපළ වෙත ආනයනික තිරිඟු පිටි තොග ගෙන්වීමේ දිනය 2023 ජනවාරි 31 දක්වා දීර්ඝ කරමින් 2023 අංක 03 දරන ගෙවීම් ක්‍රම පිළිබඳ ආනයන පාලන රෙගුලාසි (අංක 2315/46 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද) නිකුත් කරන ලදී.

2023 පෙබරවාරි 22 -

- නිශ්චිත ව දක්වා ඇති පර්යන්ත සේවා සැපයීමට අත්‍යවශ්‍යයෙන් ම අවශ්‍ය වන, භාණ්ඩ ආනයනය සඳහා සිය ගෙවීම් එවැනි පර්යන්ත නිශ්චිත ව දක්වා ඇති පර්යන්ත සේවා සැපයීමට අත්‍යවශ්‍යයෙන් ම අවශ්‍ය වන, භාණ්ඩ ආනයනය සඳහා සිය ගෙවීම් එවැනි පර්යන්ත මෙහෙයුම් මගින් ඉපැයූ විදේශ විනිමය භාවිතයෙන් පියවනු ලබන පුද්ගලයන් සඳහා විවෘත ගිණුම් සහ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ ක්‍රම සඳහා ඉඩ ලබා දෙමින් සහ
- 2022 අංක 12 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2294/29 හි පළ කරන ලද) මගින් නිකුත් කරන ලද රෙගුලාසි 5(i) ප්‍රතිස්ථාපනය කරමින්,

2023 අංක 04 දරන ගෙවීම් ක්‍රම පිළිබඳ ආනයන පාලන රෙගුලාසි (අංක 2320/46 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

- 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක

2312/78 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) මගින් නිකුත් කරන ලද 8 (ඓ) රෙගුලාසිය අහෝසි කරමින් සහ නව රෙගුලාසි ආදේශ කරමින් 2023 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2320/47 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

2023 මාර්තු 24 - 2019 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2107/45 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) මගින් නිකුත් කරන ලද 3 (ආ) රෙගුලාසිය අහෝසි කරමින් සහ නව රෙගුලාසි ආදේශ කරමින් 2023 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2324/45 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

2023 අප්‍රේල් 06 - පිළිගැනීම මත ලේඛන සහ ගෙවීම මත ලේඛන නියමයන් යටතේ කිරි පිටි සහ මයිසූර් පරිප්පු (රතු පරිප්පු - සම්පූර්ණ) ආනයනය කිරීම මත පැනවූ සීමාවන් ලිහිල් කරමින් 2023 අංක 07 දරන ගෙවීම් නියමයන් පිළිබඳ ආනයන පාලන රෙගුලාසිය (අංක 2326/40 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

- 2023 ජුනි 01 වැනි දිනට හෝ ඉන් පසු ඕනෑම වරායක් හෝ ගුවන් තොටුපළක් වෙත පැමිණි එක් වරක් පමණක් භාවිත කළ හැකි ප්ලාස්ටික් අයිතම ආනයනය කිරීම නියාමනය කරමින්, 2023 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2326/41 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලද අතර, එම භාණ්ඩ ඒවා පැමිණි දිනයේ සිට දින 30ක් ඇතුළත අපනයනය කරනු ලබන රට වෙත ප්‍රතිඅපනයනය කළ යුතු වේ.

2023 ජුනි 09 - පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ ඇතුළු ව, තාවකාලික ව අත්හිටුවන ලද භාණ්ඩ ලැයිස්තුවකට (නව සංයෝජිත වර්ගීකරණ කේත 286) ආනයනයට ඉඩ සලසමින් 2023 අංක 09 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2335/26 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

2023 ජූලි 20 - පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ ඇතුළු ව, තාවකාලික ව අත්හිටුවන ලද භාණ්ඩ ලැයිස්තුවකට (නව සංයෝජිත වර්ගීකරණ කේත 327) ආනයනයට ඉඩ සලසමින් 2023 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2341/38 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 2023 ඔක්තෝබර් 09 | - | පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ ඇතුළු ව, තාවකාලික ව අත්හිටුවන ලද භාණ්ඩ ලැයිස්තුවකට (නව සංයෝජිත වර්ගීකරණ කේත 299) ආනයනයට ඉඩ සලසමින් 2023 අංක 14 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2353/16 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී. |
| 2024 ජනවාරි 11 | - | රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලික ව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ ආනයනය සඳහා ඉඩසලසමින් 2024 අංක 01 දරන ආනයන අපනයන (පාලන) රෙගුලාසි (අංක 2366/19 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී. |
| 2024 පෙබරවාරි 07 | - | 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිකුත් කරන ලද අංක 12 (අ) රෙගුලාසිය (අංක 2312/78 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) සංශෝධනය කිරීමෙන් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි මෝටර් වාහන ආනයනය කිරීම සඳහා ලබා දෙන කාලය දීර්ඝ කරමින් 2024 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2370/15 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී. |
| 2024 පෙබරවාරි 19 | - | අනුමත කරන ලද ව්‍යවසායයක් විසින් සකස් කිරීම සහ ප්‍රතිඅපනයන කිරීමේ අරමුණ සඳහා තෝරාගත් කුළුබඩු (උදා:- ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසි) ආනයනයට ඉඩසලසමින් 2024 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2372/04 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී.<br>(මෙම රෙගුලාසි 2024 මාර්තු 19 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී) |
| 2024 පෙබරවාරි 28 | - | 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම පිළිබඳ ව ආනයන පාලන රෙගුලාසි ( අංක 2278/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) මගින් නිකුත් කරන ලද ගෙවීම මත ලේඛන (DP) සහ පිළිගැනීම මත ලේඛන (DA) යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනයට පූර්ව අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කරමින්, අංක 6 රෙගුලාසිය ඉවත් කරමින් 2024 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2373/28 දරනඅති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2024 මාර්තු 19 | | රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලික ව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ ආනයනය සඳහා ඉඩසලසමින් 2024 අංක 05 දරන ආනයන අපනයන (පාලන) රෙගුලාසි (අංක 2376/14 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) නිකුත් කරන ලදී. |

**බදු සංශෝධන**

**ආදායම් බදු**

| | | |
|---|---|---|
| 2023 මැයි 08 | - | 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කරන ලදී. |
| 2023 මැයි 31 | - | 2023 ජූනි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ දැනටමත් ලියාපදිංචි වී ඇති පුද්ගලයන් හැර, කාණ්ඩ 14ක වෘත්තිකයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ අනිවාර්ය ලියාපදිංචිය හඳුන්වා දෙන ලදී. ඉහත සඳහන් කාණ්ඩවලට ඇතුළත් නොවන, එහෙත් 2023 දෙසැම්බර් 31 වැනි දින වන විට වයස අවුරුදු 18ක් හෝ ඊට වැඩි ඕනෑම පුද්ගලයෙකු 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි විය යුතු වේ (අංක 2334/21 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |

**එකතු කළ අගය මත බදු**

| | | |
|---|---|---|
| 2023 දෙසැම්බර් 13 | - | පෙට්‍රල්, ඩීසල් සහ එල්.පී. ගෑස් ඇතුළුව අයිතම කිහිපයකට අදාළව පැවති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී (2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත). |
| 2023 දෙසැම්බර් 19 | - | භාණ්ඩ ආනයන මත මෙන් ම, භාණ්ඩ සහ සේවා සැපයුම මත පනවා ඇති එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15 සිට සියයට 18 දක්වා ඉහළ නංවන ලදී (අංක 2363/22 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2024 මාර්තු 20 | | 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි වීමේ සීමාව වසරකට රුපියල් මිලියන 80 සිට වසරකට රුපියල් මිලියන 60ක් දක්වා අඩු කරන ලදී (2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත). |

**නිෂ්පාදන/සුරා බදු**

2023 ජනවාරි 01 - 2023 ජනවාරි 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, පෙට්‍රල් සහ ඩීසල් මත පනවා ඇති නිෂ්පාදන බද්ද සංශෝධනය කරන ලදී (අංක 2312/68 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| **විස්තරය** | **සංශෝධනයට පෙර පැවති බද්ද (ලීටරයකට රුපියල්)** | **සංශෝධිත බද්ද (ලීටරයකට රුපියල්)** |
|---|---|---|
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | 27.00 | 52.00 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | 27.00 | 52.00 |
| වෙනත් | 27.00 | 52.00 |
| කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු සුපර් ඩීසල් | 13.00 | 38.00 |
| කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) ඉක්මවන නමුත් කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 500 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු වෙනත් ඩීසල් | 6.00 | 31.00 |
| වෙනත් | 13.00 | 38.00 |

2023 ජනවාරි 01 - 2023 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, දුම්වැටි මත පනවා ඇති නිෂ්පාදන බදු සංශෝධනය කරන ලදී (අංක 2312/68 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| **විස්තරය (දුම්වැටියක දිග)** | **සංශෝධනයට පෙර පැවති බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)** | **සංශෝධිත බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)** |
|---|---|---|
| < මි.මී. 60 | 6,750 | 13,360 |
| මි.මී. 60 - මි.මී. 67 | 28,850 | 34,620 |
| මි.මී. 67 - මි.මී. 72 | 41,100 | 49,320 |
| මි.මී. 72 - මි.මී. 84 | 46,600 | 55,920 |
| > මි.මී. 84 | 51,800 | 62,160 |

2023 ජනවාරි 03 - 2023 ජනවාරි 03 සිට බලපැවැත්වෙන පරිදි, මධ්‍යසාර මත පනවා ඇති සුරා බද්ද සංශෝධනය කරන ලදී (අංක 2312/70 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| **විස්තරය** | **සංශෝධනයට පෙර පැවති බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්)** | **සංශෝධිත බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්)** |
|---|---|---|
| විශේෂ අරක්කු | 4,180 | 5,000 |
| ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු | 4,460 | 5,350 |
| දේශීය ව නිපදවන ලද "විදේශීය" මද්‍යසාර | 4,570 | 5,500 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 5 හෝ ඊට අඩු මෝල්ට් මද්‍යසාර | 3,300 | 3,960 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 5 හෝ ඊට වැඩි මෝල්ට් මද්‍යසාර | 3,450 | 4,150 |
| වයින් | 3,300 | 3,960 |
| ජපන් මද්‍යසාර වර්ගයක් | 900 | 1,080 |
| දේශීය ව නිෂ්පාදිත කිරි මුසු කර නිෂ්පාදනය කළ මද්‍යසාර | - | 2,750 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 4කට වඩා නොවැඩි, දේශීය ව නිපද වූ සයිඩර් | - | 3,000 |

2023 මැයි 31 - ඉන්ධන (පෙට්‍රල් සහ ඩීසල්) මත අය කරනු ලබන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු අනුපාතිකය ලීටරයකට රුපියල් 25කින් ඉහළ නංවන ලදී (අංක 2334/23 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| **විස්තරය** | **සංශෝධනයට පෙර පැවති බද්ද (ලීටරයකට රුපියල්)** | **සංශෝධිත බද්ද (ලීටරයකට රුපියල්)** |
|---|---|---|
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | 52.00 | 77.00 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | 52.00 | 77.00 |
| වෙනත් | 52.00 | 77.00 |
| කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු සුපර් ඩීසල් | 38.00 | 63.00 |
| කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) ඉක්මවන නමුත් කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 500 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු වෙනත් ඩීසල් | 31.00 | 56.00 |
| වෙනත් | 38.00 | 63.00 |

2023 ජූනි 16 - පැල්මැටික් අම්ලය (සංයෝජිත වර්ගීකරණ කේත 2915.70.10) සහ ලෝරික් අම්ලය (සංයෝජිත වර්ගීකරණ කේත 2915.90.10) මත වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද පිරිවැය, රක්ෂණය සහ භාණ්ඩ ප්‍රවාහන වටිනාකමෙන් (CIF value) සියයට 29ක් ලෙස පනවන ලදී (අංක 2336/69 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

2023 ජූනි 30 - 2023 ජූලි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මද්‍යසාර මත පනවා ඇති සුරා බද්ද සංශෝධනය කරන ලදී (අංක 2338/57 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| **විස්තරය** | **සංශෝධනයට පෙර පැවති බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්)** | **සංශෝධිත බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්)** |
|---|---|---|
| විශේෂ අරක්කු | 5,000 | 6,000 |
| ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු | 5,350 | 6,420 |
| දේශීය ව නිපදවන ලද "විදේශීය" මද්‍යසාර | 5,500 | 6,600 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 5 හෝ ඊට අඩු මෝල්ට් මද්‍යසාර | 3,960 | 4,750 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 5 හෝ ඊට වැඩි මෝල්ට් මද්‍යසාර | 4,150 | 4,980 |
| වයින් | 3,960 | 4,750 |
| ජපන් මද්‍යසාර වර්ගයක් | 1,080 | 1,300 |
| දේශීය ව නිෂ්පාදිත කිරි මුසු කර නිෂ්පාදනය කළ මද්‍යසාර | 2,750 | 3,300 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 4කට වඩා නොවැඩි, දේශීය ව නිපද වූ සයිඩර් | 3,000 | 3,600 |

2023 ජූනි 30 - දුම්වැටි මත පනවා ඇති නිෂ්පාදන බද්ද 2023 ජූලි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරන ලදී (අංක 2338/58 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| විස්තරය (දුම්වැටියක දිග) | සංශෝධනයට පෙර පැවති බද්ද (දුම්වැටි **1,000**කට රුපියල්) | සංශෝධිත බද්ද (දුම්වැටි **1,000**කට රුපියල්) |
|---|---|---|
| < මි.මී. 60 | 13,360 | 16,030 |
| මි.මී. 60 - මි.මී. 67 | 34,620 | 41,540 |
| මි.මී. 67 - මි.මී. 72 | 49,320 | 59,180 |
| මි.මී. 72 - මි.මී. 84 | 55,920 | 67,100 |
| > මි.මී. 84 | 62,160 | 74,590 |

2023 දෙසැම්බර් 31 - මද්‍යසාර මත පනවා ඇති සුරා බද්ද 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරන ලදී (අංක 2364/35 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| විස්තරය | සංශෝධනයට පෙර පැවති බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්) | සංශෝධිත බද්ද (මද්‍යසාර ලීටරයකට රුපියල්) |
|---|---|---|
| විශේෂ අරක්කු | 6,000 | 6,840 |
| ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු | 6,420 | 7,320 |
| දේශීය ව නිපදවන ලද "විදේශීය" මද්‍යසාර | 6,600 | 7,525 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 5 හෝ ඊට අඩු මෝල්ට් මද්‍යසාර | 4,750 | 5,415 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 5 හෝ ඊට වැඩි මෝල්ට් මද්‍යසාර | 4,980 | 5,680 |
| වයින් | 4,750 | 5,415 |
| ජපන් මද්‍යසාර වර්ගයක් | 1,300 | 1,480 |
| දේශීය ව නිෂ්පාදිත කිරි මුසු කර නිෂ්පාදනය කළ මද්‍යසාර | 3,300 | 3,760 |
| ලේබලයෙහි දක්වා ඇති පරිදි නිරපේක්ෂ සැර සියයට 4කට වඩා නොවැඩි, දේශීය ව නිපද වූ සයිඩර් | 3,600 | 4,105 |

2023 දෙසැම්බර් 31 - දුම්වැටි මත පනවා ඇති නිෂ්පාදන බද්ද 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරන ලදී (අංක 2364/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

| **විස්තරය (දුම්වැටියක දිග)** | **සංශෝධනයට පෙර පැවති බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)** | **සංශෝධිත බද්ද (දුම්වැටි 1,000කට රුපියල්)** |
|---|---|---|
| < මි.මී. 60 | 16,030 | 18,270 |
| මි.මී. 60 - මි.මී. 67 | 41,540 | 47,360 |
| මි.මී. 67 - මි.මී. 72 | 59,180 | 67,470 |
| මි.මී. 72 - මි.මී. 84 | 67,100 | 76,490 |
| > මි.මී. 84 | 74,590 | 85,030 |

2023 දෙසැම්බර් 31 - පෙට්‍රල් සහ ඩීසල් මත පනවා ඇති නිෂ්පාදන බද්ද 2024 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී (අංක 2364/36 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

| **විස්තරය** | **සංශෝධනයට පෙර පැවති බද්ද (ලීටරයකට රුපියල්)** | **සංශෝධිත බද්ද (ලීටරයකට රුපියල්)** |
|---|---|---|
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | 77.00 | 72.00 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | 77.00 | 72.00 |
| වෙනත් | 77.00 | 72.00 |
| කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු සුපර් ඩීසල් | 63.00 | 57.00 |
| කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 10 (මිලියනයකට කොටස්) ඉක්මවන නමුත් කිලෝග්‍රෑමයකට මිලි ග්‍රෑම් 500 (මිලියනයකට කොටස්) නොඉක්මවන සල්ෆර් අඩංගු වෙනත් ඩීසල් | 56.00 | 50.00 |
| වෙනත් | 63.00 | 57.00 |

**ආනයන තීරු බදු**

2023 මාර්තු 28 - 2023 අයවැයෙහි යෝජනා අංක 34.6 හා අනුකූල ව, සෙස් බද්ද ඉවත් කිරීමට සහාය වීම සඳහා ආනයන තීරු බදුවල ත්‍රිත්ත්ව කාණ්ඩ තීරු බදු ක්‍රමය 2023 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 0, සියයට 10 සහ සියයට 15 සිට සියයට 0, සියයට 15 සහ සියයට 20 දක්වා සංශෝධනය කරන ලදී (අංක 2325/07 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

2023 මැයි 31 - 2023 ජුනි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි තෝරාගත් භාණ්ඩ මත ආනයන තීරු බද්දෙහි ප්‍රතිශතයක් ලෙස අධිභාර බද්ද පනවන ලදී (අංක 2334/28 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

2023 ජුනි 16 - දේශීය රූපලාවන්‍ය කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා පාම් තෙල් මේද අම්ලයේ තීරු බදු ව්‍යුහයට සමාන තීරු බදු ව්‍යුහයක් පැල්මැටික් අම්ලය සහ ලෝරික් අම්ලය සඳහා පනවනු ලැබූ අතර, පැල්මැටික් අම්ලය සහ ලෝරික් අම්ලය සඳහා නව සංයෝජිත වර්ගීකරණ කේත (ජාතික උප බෙදීම්) නිර්මාණය කරන ලදී (අංක 2336/72 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

2023 ජුනි 30 - ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම (SLSFTA) යටතේ ආනයන තීරු බදු සඳහා වන තීරු බදු ලිහිල්කරණ වැඩසටහනෙහි "6" කාණ්ඩය යටතේ වාර්ෂිකව ඇති එක හා සමාන වාරික හයෙන් පළමු වාරිකය අනුව තීරු බදු අයිතම 1,238ක් 2023 ජූලි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී (අංක 2338/54 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

2023 ජූලි 21 - රැකියා උත්පාදනය කිරීම සහ නව්‍ය හා තිරසර නිෂ්පාදිත සංවර්ධනය කිරීම සමඟම දේශීය තීන්ත නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණැති ව, මුද්‍රණය කිරීම සඳහා යොදා ගන්නා තීන්ත නිෂ්පාදනය සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ ආනයනය කිරීමේදී ඒ අතර පවතින තීරු බදු අක්‍රමිකතාව ඉවත් කිරීමට, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශයට යටත්ව, සංයෝජිත වර්ගීකරණ 3903.90.10 සහ 3906.90.10 මත සියයට 5ක සහනදායී ආනයන තීරු බදු අනුපාතයක් අනුපාතිකය හඳුන්වා දෙන ලදී (අංක 2341/64 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

2023 අගෝස්තු 29 - තිරිඟු පිටි ආනයනය මත පනවා ඇති කිලෝග්‍රෑමයකට සියයට 15ක් හෝ රුපියල් 16ක් වන ආනයන තීරු බද්ද කිලෝග්‍රෑමයකට සියයට 20ක් හෝ රුපියල් 27ක් දක්වා ඉහළ නංවන ලදී (අංක 2347/06 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය).

**සෙස් බද්ද**

| | | |
|---|---|---|
| 2023 මාර්තු 28 | - | 2023 අයවැයෙහි යෝජනා අංක 34.6ට අනුව, වාර්ෂික වාරික තුනකින් සෙස් බද්ද ඉවත් කිරීම ලෝක බැංකුවේ යෝජිත සංවර්ධන ප්‍රතිපත්ති ණය පහසුකමෙහි පූර්ව වැඩසටහන් කොන්දේසිවලින් එකක් වන අතර, සෙස් බද්දෙහි ප්‍රථම වාරිකය ඉවත් කිරීම, 2023 මාර්තු 31 දිනට පෙර ක්‍රියාත්මක කළ යුතු වේ. ඒ අනුව, සෙස් බද්දෙහි විචලනය වන අනුපාතිකයන්ට යටත්ව, සංයෝජිත වර්ගීකරණ කේත 8,155න් සංයෝජිත වර්ගීකරණ කේත 2,668ක (ඉලක්කම් 8ක පදනම මත) සෙස් බද්දෙහි පළමු වාරිකය ඉවත් කිරීම සඳහා වන ගැසට් නිවේදනය නිකුත් කරන ලදී (අංක 2325/06 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |
| 2023 ජූනි 16 | - | සිමෙන්ති ආනයනය මත වන සෙස් බද්ද ඉහළ නංවනු ලැබූ අතර, ගෝලීය සහ දේශීය ආර්ථික තත්ත්වයන්ට අනුව සිමෙන්තිවල සිල්ලර මිල ගණන් ගැළපීම සඳහා සිමෙන්ති කැට ආනයන මත කිලෝග්‍රෑමයකට රුපියලක් ලෙස සෙස් බද්ද පනවන ලදී (අංක 2336/71 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |
| 2023 ජූලි 21 | - | මුද්‍රණය කිරීමේ තීන්ත දේශීය ව නිෂ්පාදනය කිරීම සඳහා අතරමැදි භාණ්ඩ ලෙස මූලික ස්වරූපයෙන් ආනයනය කරනු ලබන පොලිමර් සහ නිමි භාණ්ඩ ලෙස ආනයනය කරනු ලබන මුද්‍රණය කිරීමේ තීන්තවල නිරීක්ෂණය වී ඇති තීරුබදු අක්‍රමිකතාව සඳහා පිළියම් යෙදීමට කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත ලියාපදිංචි වූ දේශීය මුද්‍රණ තීන්ත නිෂ්පාදකයන් විසින් මූලික ස්වරූපයෙන් ස්ටයිරින් පොලිමර් ආනයනය කිරීම සහ මූලික ස්වරූපයෙන් ඇක්රිලික් පොලිමර් ආනයනය කිරීම සඳහා සෙස් බද්දෙන් නිදහස් කිරීමක් ලබා දෙන ලදී. (අංක 2341/63 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |

**වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද** (PAL)

| | | |
|---|---|---|
| 2023 අප්‍රේල් 04 | - | 2023 අයවැය යෝජනාවට අනුව වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද වසර පහකින් ඉවත් කිරීමෙහි ප්‍රථම පියවර ලෙස තීරු බදු අයිතම 1,631ක් මත පනවා ඇති වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද ඉවත් කරන ලදී (අංක 2326/02 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |
| 2023 සැප්තැම්බර් 21 | - | කිරි සහ ක්‍රීම් ( සාන්ද්‍රීය හෝ සීනි හෝ වෙනත් පැණි රස ගන්වන ද්‍රව්‍ය එකතු කර ඇති) සඳහා ලබා දී තිබූ බද්දෙන් නිදහස් කිරීම ඉවත් කරන ලදී. (අංක 2350/45 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |

| | | |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 | - | පෙට්‍රල්, ඩීසල් සහ එල්.පී. ගෑස් ඇතුළු ව ඇතැම් අයිතම මත පනවා ඇති වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිදහස් කරන ලදී (අංක 2364/37 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |

**අනෙකුත් බදු සහ අයබදු**

| | | |
|---|---|---|
| 2023 පෙබරවාරි 07 | - | මඩකළපු ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි (BTIA) සිදු කරනු ලබන සෑම ගුවන්යානා ගොඩබෑස්වීමක් සහ ගුවන්යානා ගාල් කර තැබීමක් සඳහා ම ගුවන්තොටුපළ භාවිත කිරීමේ ගාස්තු පනවන ලදී (BTIA) (අංක 2318/14 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |
| 2023 මැයි 31 | - | පූර්ණ විද්‍යුත් මෝටර් රථවල බදු නිදහස් සීමාව සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා රුපියල් මිලියන 6 සිට රුපියල් මිලියන 12ක් දක්වා ඉහළ නැංවූ, 2023 පෙබරවාරි **10** වැනි දිනැති අංක 2318/53 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද ප්‍රේෂණ සලකා බැලීම, ණයවර ලිපි පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීමට අදාළ කාල පරිච්ඡේද දීර්ඝ කරන ලදී (අංක 2334/24 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |
| 2023 අගෝස්තු 21 | - | 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් පනවන ලදී.. |
| 2024 මාර්තු 20 | - | 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රුපියල් මිලියන 120 සිට රුපියල් මිලියන 60 දක්වා අඩු කරන ලදී (2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත). |

**රාජ්‍ය වියදම**

| | | |
|---|---|---|
| 2023 ජනවාරි 12 | - | 2023 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන් විසින් සේවානියුක්ති ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු සඳහා උපදෙස් නිකුත් කරන ලදී. සාමූහික ගිවිසුම් යටතේ පෞද්ගලික වේතන ගෙවනු ලැබුව ද, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු **(APIT)** බදු ගෙවිය යුතු සේවකයන්ගේ ඉපැයීම්වලින් අඩු කර ගත යුතු බවත්, බද්ද එම ආයතනයට (රාජ්‍ය ව්‍යවසායයන්) වියදමක් නොවිය යුතු බවත් ඉන් දැනුවත් කෙරිණි (රාජ්‍ය ව්‍යවසායය චක්‍රලේඛ අංක 01/2023). |
| 2023 ජනවාරි 27 | - | රාජ්‍ය වියදම් කළමනාකරණය සහ 2023 වසරේ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන සියයට 6කින් අඩු කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී (ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2023). |

| | | |
|---|---|---|
| 2023 අප්‍රේල් 21 | - | 2023 ජූලි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයේ උපලේඛන හඳුන්වා දෙන ලදී (අංක 2328/13 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය). |
| 2023 ජූනි 16 | - | රාජ්‍ය වියදම් විචක්ෂණශීලීව සහ ඵලදායීව වියදම් කිරීම මගින් ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම තහවුරු කිරීම සඳහා නව සංවර්ධන ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රමවේදයකට අනුකූලව ඇගැයීම සඳහා ජාතික සංවර්ධනය කමිටුවේ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී (ජාතික අයවැය චක්‍රලේඛ අංක 0132023). |
| 2023 දෙසැම්බර් 13 | - | 2023 අංක 34 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ අතර, එය 2023 දෙසැම්බර් 13 වැනි දින පළ කරන ලදී. |

**අනෙකුත්**

| | | |
|---|---|---|
| 2023 අගෝස්තු 08 | - | 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |